විදුලි පණිවුඩ : " විශ්‍රාම වැටුප් " කොළඹ
தந்தி: "ஓய்வூதியம்" கொழும்பு
Telegrams : " PENSIONS " Colombo

දුරකථන / தொலைபேசி / Telephones: 2320316, 2421786, 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2342078

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**
**ஓய்வூதியத் திணைக்களம்**
**DEPARTMENT OF PENSIONS**

මගේ අංකය / எனது இல. / My No.: විවැ චක්‍රලේඛ / 2006
ඔබේ අංකය / உமது இல. / Your No.:

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.

மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.

Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.


දිනය / திகதி / Date: 2006- 10- 30

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## <u>විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද වි වැ චක්‍රලේඛ 6 / 2004 හා 2 / 2006 වලට වැඩිමනත් වශයෙනි.

ස්ථිරව හෝ ද්විතීය පදනම මත රාජ්‍ය සේවයෙන් වෙනත් ආයතනවලට මුදාහැර සිටි නිලධාරීන් එම සේවය අවසන් කිරීමෙන් පසු විශ්‍රාම ගැන්වීමේදී සමහර අවස්ථාවල රාජ්‍ය සේවයේ වැටුපට නොව එම ආයතනයෙන් ලද වැටුප් පදනම් කරගෙන විශ්‍රාම වැටුප් ගණනය කර ඇත. (උදාහරණ ලෙස ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, තේ මණ්ඩලය)

එහෙත් මගේ ඉහත චක්‍රලේඛයන්ට අනුව විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේදී පදනම් කර ගත යුත්තේ ඔවුන් අවසන්වරට රජයේ සේවය කරන ලද අවස්ථාවේ ලබන ලද වැටුප් පරිමාණය හා වැටුප් තලය බව සලකන්න. දැනටමත් උපදෙස්වලට පටහැනිව ක්‍රියා කර විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කර ඇත්නම් එසේ වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමටත් මෙයින් අනුමැතිය දෙමි.

**කේ. ඒ. තිලකරත්න**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.